සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 21 S

නම ..............................................

සිංහල භාෂාව හා සාහිත්‍යය - I කොටස

කාලය පැය දෙකයි

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

✶ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) වෘක්ෂලතා පරිසරය අංලකාර කරයි.

(1) කඳුවැටි (2) ඇළ දොළ (3) ගස් වැල් (4) දිය දහරා

(2) ඇය උඩඟු කාන්තාවක් වූවාය.

(1) අහංකාර (2) නිහඬ (3) අවංක (4) කාරුණික

(3) විකසිත පුෂ්පයෝ සුවඳ විහිදුවති.

(1) පරවුණු (2) මැලවුණු (3) මුකුලිත (4) පිපුණු

✶ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.

(4) නිශ්චල - .........................

(5) පළල - .........................

(6) දොම්නස - .....................

✶ අංක 07 සහ 08 ප්‍රශ්නවල පිල්ලම් පිළිවෙළට නිවැරදිව යොදා ඇති වචනය යටින් ඉරක් අඳින්න.

(7) ගැටපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල.

(1) ගෘහය (2) කුඹියා (3) කෘමියා (4) භූමිය

(8) ඇලපිල්ල, හල් ලකුණ, ගැටපිලි දෙක, හල් ලකුණ

(1) කර්තෘ (2) ශාස්තෘන් (3) කෘතිම (4) කෛලාස

✶ අංක 09 සහ 10 ප්‍රශ්න යටතේ දී ඇති වචනයන් හි ස්වර හා ව්‍යංජන අක්ෂර වෙන්කර දක්වන්න.

(9) කෞතුකාගාරය - .....................................

(10) රසිකයා - .....................................

✶ අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි උක්ත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(11) ...................................... පාසල් වත්ත පිරිසිදු කළහ.

(1) සිසුන් (2) ශිෂ්‍යයන් (3) සිසුවෙක් (4) සිසුහු

(12) .................................... මිහිරි ගීයක් ගයන්නීය.

(1) දූරියෝ (2) දූරියන් (3) දූරියක් (4) දූරියක

(13) .................................... මිරිස් පාත්තියේ වල්පැළ ගලවා දමුවේය.

(1) ගෙවිලිය (2) ගොවියා (3) ගොවියෙකු (4) ගෙවිලියක

LIVEWORKSHEETS

* **අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ ඒකවචන පදය තිත් ඉර මත ලියන්න.**

(14) <u>මිනිස්සු</u> ශබ්දය කුමක්දැයි විමසා බැලූහ. ...............................................

(15) <u>නාවිකයෝ</u> සාර්ථකව මුහුදු ගමන් නිමා කරති. ....................................

* **අංක 16 සහ 17 ප්‍රශ්නවල ඉරිඇඳි පදය අයත් පුරුෂය ලියන්න.**

(16) <u>ගුරුවරු</u> කාර්යාලයට පැමිණෙති. .................................

(17) <u>මම</u> පන්තියට ගියෙමි. ..............................

* **අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අනුක්ත පදය ලියන්න.**

(18) <u>අපි</u> සතුටින් නාට්‍ය බැලුවෙමු. ............................

(19) <u>කම්කරුවෝ</u> මාර්ගය පිරිසිදු කරති. .........................

(20) <u>ළමයා</u> මල් පැළ සිටුවයි. ..............................

(ලකුණු 2x20=40)

LIVEWORKSHEETS